# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2019 අංක 4 දරන
## ණය සහනදායක (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2019 පෙබරවාරි මස 05 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2019 පෙබරවාරි මස 08 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිල :** රු. 8.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2019 අංක 4 දරන
## ණය සහනදායක (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2019 පෙබරවාරි මස 05 වන දින]

එල්. ඩී.— ඕ. 72/2017

**(81 වන අධිකාරය වූ ) ණය සහනදායක ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2019 අංක 4 දරන ණය සහනදායක (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (81 වන අධිකාරය වූ) ණය සහනදායක ආඥාපනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 81 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "සාමාජිකයන් පස්දෙනෙකුගෙන් සමන්විත විය යුතු", යන වචනවල සිට "සභාපතිවරයා ලෙස නම් කරනු ලැබිය යුතු ය." දක්වා වන වචන වෙනුවට "සාමාජිකයන් එකොළොස් දෙනෙකුගෙන් සමන්විත විය යුතු ශ්‍රී ලංකා ණය සහනදායක මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) මණ්ඩලය –

(අ) (i) මහාධිකරණ විනිසුරුවරයකු ලෙස හෝ දිසා අධිකරණ විනිසුරුවරයකු ලෙස විනිශ්චයකාර ධුරයක් දරනු ලබන හෝ දරා ඇති ; හෝ

(ii) නීතිඥවරයකු ලෙස අවුරුදු පහළොවකට නොඅඩු වෘත්තීය පළපුරුද්දක් සහිත,

යන තැනැත්තන්ගෙන් සමන්විත වන්නා වූ සාමාජිකයන් හත් දෙනෙකුගෙන්; සහ

(ආ) (i) නීතිඥවරයකු ලෙස අවුරුදු දහයකට නොඅඩු වෘත්තීය පළපුරුද්දක් සහිත;

(ii) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ දීප ව්‍යාප්ත සේවයක I වන ශ්‍රේණියේ ධුරයක තනතුරක් දරනු ලබන හෝ දරා ඇති; හෝ

(iii) වෙළඳ හා වාණිජ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් සහිත,

තැනැත්තන්ගෙන් සමන්විත වන්නා වූ සාමාජිකයන් හතර දෙනෙකුගෙන්,

සමන්විත විය යුතු ය.";

(3) එම වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(3) අමාත්‍යවරයා විසින්, (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලබන සාමාජිකයකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ "මණ්ඩලය විසින් කලින් කලට", යන වචන වෙනුවට "අමාත්‍යවරයා විසින් කලින් කලට", යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"ශාඛා මණ්ඩලවල සංයුතිය.

8. (1) අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සභාපතිවරයකුගෙන් හා හතරදෙනෙකු නොඉක්මවන්නා වූ හා දෙදෙනෙකුට නොඅඩු වන්නා වූ වෙනත් සාමාජිකයන් සංඛ්‍යාවකින් සෑම ශාඛා මණ්ඩලයක්ම සමන්විත විය යුතු ය.

(2) සෑම ශාඛා මණ්ඩලයකම සභාපතිවරයා මණ්ඩලයේ සාමාජිකයකු විය යුතු අතර –

(අ) මහාධිකරණ විනිසුරුවරයකු ලෙස හෝ දිසා අධිකරණ විනිසුරුවරයකු ලෙස

විනිශ්චයකාර ධුරයක් දරනු ලබන හෝ දරා ඇති තැනැත්තකු; හෝ

(ආ) නීතිඥවරයකු ලෙස අවුරුදු පහළොවකට නොඅඩු වෘත්තීය අත්දැකීම් සහිත තැනැත්තකු,

විය යුතු ය.

(3) සෑම ශාඛා මණ්ඩලයකම අනෙකුත් සාමාජිකයන් –

(අ) නීතිඥවරයකු ලෙස අවුරුදු දහයකට නොඅඩු වෘත්තීය අත්දැකීම් සහිත; හෝ

(ආ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ දීපව්‍යාප්ත සේවයක I වන ශ්‍රේණියේ ධුරයක තනතුරක් දරන හෝ දරා ඇති,

තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(4) ශාඛා මණ්ඩලයේ ඕනෑම සාමාජිකයකු ඕනෑම අවස්ථාවකදී —

(අ) ශාඛා මණ්ඩලයේ සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය;

(ආ) හේතු දක්වා අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(5) ධුරයෙන් ඉවත් කරන ලද තැනැත්තකු හැර ශාඛා මණ්ඩලයේ සාමාජිකයකු වීම අවසන් වන යම් තැනැත්තකු නැවත පත් කරනු ලැබීමට සුදුසුකම් ලැබිය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.